# ඩී.එස්. සේනානායක විද්‍යාලය, කොළඹ 07.

**දෙවන වාර පරීක්ෂණය - 2016**
**12 ශ්‍රේණිය**
**දේශපාලන විද්‍යාව - I කොටස**

*කාලය පැය 03 යි*

- **ප්‍රශ්න සියල්ලටම පිළිතුරු ලියන්න. ප්‍රශ්න සියල්ලටම එම ප්‍රශ්න පත්‍රයේම පිළිතුරු සපයන්න.**
- **1-10 දක්වා ප්‍රශ්නවලදී දී ඇති ප්‍රකාශන අතුරින් එකක් සාවද්‍ය වේ. එහි අංකය පිළිතුරු සඳහන් කළයුතු ස්ථානයේ යොදන්න.**

01. දේශපාලන විද්‍යාව සමාජ විද්‍යාවක් ලෙස සලකනු ලබන්නේ,
    i. විෂය අන්තර්ගතය වන්නේ මිනිසා සහ ඔහුගේ දේශපාලන හැසිරීමය.විෂය සම්බන්ධතා පවත්වන්නේ තවත් සමාජ විද්‍යා විෂයයක් සමගය.
    ii. විෂය හැදෑරීමේ විද්‍යාගාරය වන්නේ මිනිස් සමාජයයි.
    iii. විෂය හැදෑරීම සමාජ විද්‍යාත්මක විශ්ලේෂණ විධි ක්‍රම භාවිතා කරයි.
    iv. ශුද්ධ විද්‍යාත්මක ශිල්ප ක්‍රම කිසිසේත්ම භාවිතා කළ නොහැකි ය.

(.........)

02. ජාතික රාජ්‍ය ක්‍රමයේ ප්‍රධාන අංග ලක්ෂණයකි.
    i. නීත්‍යානුකූල පදනම මත අධිකාරී බලය යොදමින් නියෝග බලාත්මක කරයි.
    ii. උත්තරීතර හා අසහාය බලයේ ඒකාධිකාරය හිමිය.
    iii. දෛනික වැඩකටයුතු කරගත යාමට පරිපාලන යන්ත්‍රය භාවිතයට ගනියි.
    iv. පැවරී ඇති වැඩ කටයුතු මුදා හැරලීමට ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුක්‍රමය භාවිතයට ගනියි.
    v. නීතිය හා සාමය ආරක්ෂා කර පවත්වාගෙන යාමට පොලිසිය හා හමුදා භාවිතා කරයි.

(.........)

03. දේශපාලන විද්‍යාවේ සම්ප්‍රදායික ප්‍රවේශය අවධානය යොමු කරන්නේ,
    i. රාජ්‍ය සහ ආණ්ඩුව පිළිබඳව හැදෑරීමටයි.
    ii. මිනිසා හා රාජ්‍ය අතර සබඳතාවය හැදෑරීමටයි.
    iii. ආණ්ඩුක්‍රමයන් පිළිබඳව තුලනාත්මකව හැදෑරීමටයි.
    iv. දේශපාලන ප්‍රංචයන්ගේ දාර්ශනික හැඩ ගැස්ම පිළිබඳවයි.
    v. පුද්ගලයින් හා කණ්ඩායම් වල දේශපාලන ක්‍රියාකාරකම්වල ප්‍රත්‍යක්ෂ මූලික විශ්ලේෂණයන් පිළිබඳවයි.

(.........)

04. බලතල බෙදීමේ න්‍යාය
    i. රාජ්‍යයේ බලය විමධ්‍යගත කිරීම පිළිබඳ කථා කෙරෙන න්‍යායකි.
    ii. ආණ්ඩුවේ බලය බෙදීම පිළිබඳ අවධාරණය කරන න්‍යායයකි.
    iii. විධායකය ආඥාදායක වීම වැලැක්වීම සඳහා ප්‍රයෝජනවත් මාධ්‍යයකි.
    iv. ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුකරණයේ අවශ්‍ය මූලධර්මයක් ලෙස සැලකේ.
    v. ආණ්ඩුවේ කාර්යයන් හඳුනාගත හැකි අයුරින් බෙදිය යුතු බව කියයි.

(.........)

05. සමාජය
    i. සම්බන්ධතා ජාලයකි
    ii. රාජ්‍යයට ද්විතිය වෙයි.
    iii. මානවයින්ගේ සමාජීය සම්බන්ධතා සඳහා ප්‍රමිති පිළියෙල කරයි.
    iv. නිශ්චිත දේශ සීමාවකින් වෙන් කළ නොහැකිය.
    v. යහපත් ජිවිතයක් සඳහා අත්‍යාවශ්‍ය කොන්දේසියකි.

(.........)

06. ස්වාධිපත්‍ය
    i. අසහාය හා අසීමිත බලය යන්න නිරූපනය කෙරේ.
    ii. රාජ්‍යයට බලාධිකාරී බලයේ ඒකාධිකාරය සපයනු ලැබේ.
    iii. රාජ්‍යය අධිකරණය හා විධායකය හරහා ක්‍රියාවට නංවයි.
    iv. රාජ්‍යය අනෙක් සැම දේශපාලන හා සමාජ සංවිධානවලට වඩා ඉහළින් තබයි.
    v. අභ්‍යන්තර හා බාහිර වශයෙන් පැති කඩ දෙකකි.

(.........)

07. ලිබරල්වාදීන්ට අනුව රාජ්‍යය,
   i. පොදු සුභ සිද්ධිය සඳහා වූ ආයතනයකි.
   ii. මිනිසාගේ පෞද්ගලික නිදහස ආරක්ෂා කරයි.
   iii. නීතියේ ආධිපත්‍යයට මුල් තැනදේ.
   iv. මහජන පදනමක් මත බිහිවූ ආණ්ඩුවකින් සමන්විය.
   v. මහජන පදනමක් මත බිහිවූ ආණ්ඩුවකින් සමන්විතය.
   vi. පොදු සේවා සැපයීම පෞද්ගලික අංශයට භාරදේ.

(………)

08. පැසිස්ට් රාජ්‍යයක දැකිය හැකි අංග ලක්ෂණයකි.
   i. විකල්ප දේශපාලන මතවාදයන්ට ඉඩ සැලසීම.
   ii. රාජ්‍ය වන්දනීය උත්තරීතර ආයතනයක් බවට පත්කිරීම.
   iii. පුද්ගල නිදහස හා අයිතිවාසිකම නොපිළිගැනීම.
   iv. සමාජ අසමානතාවය පිළිගැනීම.
   v. බුද්ධි විරෝධී වීම.

(………)

09. ඒකතන්ත්‍ර ආණ්ඩුක්‍රමයක මූලික ලක්ෂණයකි.
   i. පැහැදිලි දේශපාලන ආර්ථික හා සමාජ දර්ශනයක් නොමැතිවීම.
   ii. තරඟකාරී දේශපාලන පක්ෂ ක්‍රමයක් නොමැතිවීම.
   iii. අනුග්‍රාහකයන් පත් කිරීම මත ආණ්ඩුව පැවතීම.
   iv. කලින් කළ පවත්වන මැතිවරණ මගින් පාලකයන් තෝරා ගැනීම.
   v. පාලකයා විසින්ම අභිමතය පරිදි රාජ්‍ය බලය ක්‍රියාවට නැංවීම.

(………)

10. ජනාධිපති ආණ්ඩුක්‍රමයක ලක්ෂණයකි.
   i. විධායක ජනාධිපතිවරයා වෙනම මැතිවරණයකින් තෝරාගැනීම.
   ii. විධායකය ව්‍යවස්ථාදායකය මත රඳා නොපැවතීම.
   iii. විධායකය ව්‍යවස්ථාදායකයට වග නොකීම.
   iv. විධායකයන්ට ව්‍යවස්ථාදායකය පාලනය කළ හැකිවීම.
   v. විධායකයට ව්‍යවස්ථාදායකය විසුරුවා හැරීමේ බලය හිමිවීම.

(………)

**11-20 තෙක් ප්‍රශ්නවලදී අදාළ ප්‍රකාශය තෝරන්න.**

11. ආණ්ඩුවේ බලය සංවරණය කිරීමේ මාර්ගයක් නොවේ.
   i. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව
   ii. සන්නද්ධ හමුදා සහ පොලිසිය
   iii. බලතල බෙදීම
   iv. අධිකරණ ප්‍රතිනිරීක්ෂණ බලය
   v. නිදහස් මාධ්‍යයන්හි පැවැත්ම

(………)

12. බලපෑමේ කණ්ඩායම් සඳහා නොසැසඳෙන ප්‍රකාශයකි.
   i. ආශා කණ්ඩායම් ලෙස හඳුන්වයි.
   ii. ප්‍රජාතන්තිය පාලනයක් සඳහා අහිතකර බලපෑම් කරයි.
   iii. ලිබරල් ප්‍රජාතන්ත්‍රීය දේශපාලන ක්‍රම තුළ පමණක් දැකිය හැකිය.
   iv. ආණ්ඩුවේ ප්‍රතිපත්ති හා ක්‍රියාවන්ම එරෙහිවීමට සංවිධානය වූවකි.
   v. විශේෂිත කරුණු හෝ විශේෂිත කණ්ඩායමක ආශා පිළිබඳ සැලකිලිමත් වේ.

(………)

13. සන්ධිය ආණ්ඩුක්‍රමයේ අවාසිදායක නොවන ලක්ෂණයකි.
   i. කාර්යක්ෂමතාව දුබලවීම.
   ii. සාර්ථක විදේශ ප්‍රතිපත්තියක් ක්‍රියාවට නැංවිය නොහැකිවීම.
   iii. විවිධත්වය එසේ පවත්වා ගැනීම නිසා වාර්ගික ගැටුම් ඇතිවීම.
   iv. පරිපාලන ඒකීයත්වය ගොඩ නගා ගැනීමට බැරිවීම.
   v. විශාල රටක සංවර්ධනය අඩාල වීම.

(………)

14. සමානුපාතික නියෝජන ක්‍රමයේ අයහපත් ලක්ෂණයක්
   i. සුළු ජන පක්ෂවලටත් බලය ලැබිය හැකිවීම.
   ii. ඡන්දය අපතේ යාම අවම වීම.
   iii. අසමානුපාතික නියෝජනය අවම වීම.
   iv. ඡන්දදායකයා ඉදිරියේ ඇතිවරණය පුලුල්වීම.
   v. ඡන්ද දායකයා හා මන්ත්‍රීවරයා අතර බැඳීම් ලිහිල්වීම.

(………)

15. යහපාලනයේ මූලික ලක්ෂණයක් නොවේ.
   i. නීතියේ ආධිපත්‍යය
   ii. වගකීම
   iii. සහභාගිත්වය
   iv. ස්වාධීනත්වය ආරක්ෂා වීම
   v. විනිවිද භාවය

(………)

16. දේශපාලන පක්ෂයක කාර්යයන් නොවන්නේ,
   i. දේශපාලන ක්‍රීඩාවේ නියැලේ
   ii. පෞද්ගලික ආශාවන් වර්ධනය කරයි.
   iii. දේශපාලන හා ආර්ථික මතවාද අනුව එකිනෙකෙන් වෙනස් වේ.
   iv. මිනිසුන් දේශපාලන වශයෙන් දැනුවත් කරයි.
   v. අනාගත නායකයින් පුහුණු කරයි.

(………)

17. මහජන මතය ඇතිකිරීමෙලා බලපාන සාධකයක් නොවන්නේ,
   i. අධ්‍යයනය
   ii. සමාජ සංවිධාන
   iii. ආර්ථික කරුණු
   iv. කලා නිර්මාණ
   v. ජනමත නායකයින්

(………)

18. සුබ සාධක රාජ්‍යය ක්‍රමයට ලෝකය යොමුවීමට බලපාන හේතුවකි.
   i. ජාතික රාජ්‍ය ආර්ථික වශයෙන් ශක්තිමත් වීම.
   ii. 1917 රුසියන් විප්ලමයෙන් පසු සමාජවාදී රාජ්‍යයක් ගොඩ නැගීම.
   iii. කාර්මිකරණය
   iv. නව දේශපාලන චින්තනයේ බලපෑම.
   v. මානව අයිතිවාසිකම් වලට ලෝකය තුළ පිළිගැනීමක් ලැබීම.

(………)

19. දේශපාලන සමාජනුයෝජනයට බලනොපාන සාධකයකි.
   i. ව්‍යාපාරිකයන්
   ii. ජනමත නායකයන්
   iii. ආර්ථික සාධක
   iv. දේශපාලන පක්ෂ
   v. ජන සන්නිවේදන මාධ්‍යයන්

(………)

20. අධිකරණයේ කාර්යයක් නොවේ.
   i. විනිසුරුවන් පත්කිරීම
   ii. නඩු විනිශ්ච කිරීම
   iii. උපදේශනය
   iv. පුරවැසි අයිතීන් සුරක්ෂිත කිරීම
   v. නීතිය අර්ථකථනය කිරීම

(………)

## A - කොටස

**සියළුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

01. මිනිසුන් දේශපාලනය ඉගෙනගන්නා ප්‍රධාන මාර්ග 2 ක් ඇති බව පිළිගැනේ. ඒ මොනවාද ?
   i. ………………………………. ii. ……………………………………….

02. පහත සඳහන් කෘතීන් දෙක රචනා කළ කතුවරුන් දෙදෙනා නම් කරන්න.
   i. සමූහාණ්ඩුව ……………………………….
   ii. දේශපාලන ව්‍යාකරණය ……………………………………….

03. මාක්ස්වාදීන්ට අනුව ධනපති සමාජය සමන්විත වන්නේ අන්‍යෝන්‍යය වශයෙන් එකිනෙකට විරුද්ධ වූ සමාජ පංති දෙකකිනි. මෙම සමාජ පන්ති 2 නම් කරන්න.

   i. ………………………………. ii. ……………………………………….

04. ව්‍යවස්ථානුකූල වාදය යටතේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සම්බන්ධ මූලික පිළිගැනීම් 2 ක් ඇත. එම නිතිමය පිළිගැනීම් 2 දක්වන්න.

i. ………………………………. ii. …………………………………….

05. නූතන ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුක්‍රම අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද ?

i. ………………………………. ii. …………………………………….

06. සමාජ සම්මුතිවාදීන් ඔවුන්ගේ සමාජ සම්මුතිය පිළිබඳ විග්‍රහයේදී පිළිගත් පොදු මූලික පිළිගැනීම් දෙකක් විය ඒ මොනවාද ?

i. ………………………………. ii. …………………………………….

07. රාජ්‍යයක ස්වාධිපත්‍යය පැති දෙකකින් යුක්තය ඒවා නම් කරන්න.

i. ………………………………. ii. …………………………………….

08. ජනාධිපති ආණ්ඩුක්‍රමයකින් කැබිනට් ආණ්ඩුක්‍රමය වෙන් කර හඳුනා ගැනීමට බලපාන ප්‍රධාන ලක්ෂණ දෙක ලියන්න.

i. ………………………………. ii. …………………………………….

09. දේශපාලන පක්ෂ මගින් කෙරෙන කාර්‍යයන් 2 ක් දක්වන්න.

i. ……………………………………
ii. ……………………………………

10. ජනතාව ආණ්ඩුකරණයට සම්බන්ධ වන ප්‍රබලම අවස්ථාව වන්නේ මැතිවරණවලදී ඡන්දය පාවිච්චි කිරීමයි. මෙම මැතිවරණ පැවැත්වෙන ප්‍රධාන ආකාර 2 නම් කරන්න.
i. ……………………………………
iii. ……………………………………

## B කොටස

**පහත සඳහන් ප්‍රශ්නවලින් ඔබ කැමති ප්‍රශ්න 3 කට පිළිතුරු සපයන්න.**

01. දේශපාලන විද්‍යාව හැදෑරීමේ විධිමත් අධ්‍යයන ක්‍රම හඳුන්වා ඒවා පැහැදිලි කරන්න.

02. i. රාජ්‍යයක මූලික ලක්ෂණ පැහැදිලි කරන්න.
ii. සමාගම් අතර රාජ්‍යය උත්තරීතර සමාගමකි. හේතු දක්වන්න.

03. ජනාධිපති ආණ්ඩුක්‍රමයක මූලික ලක්ෂණ දක්වා එය කැබිනට් ආණ්ඩුක්‍රමයකට වඩා ප්‍රජාතන්ත්‍රවාදී බවින් අඩුයි යන තර්කයට හේතු දක්වන්න.

04. බලතල බෙදීමේ න්‍යාය පිළිබඳ විමර්ශනයක් කරන්න.

05. පහත දැක්වෙන ඒවායින් ඔබ කැමති මාතෘකා 2 ක් පිළිබඳ පැහැදිලි කරන්න.
i. බලපෑමේ කණ්ඩායම
ii. දේශපාලන සමාජානුයෝජනය
iii. මහජන මතය
iv. සිවිල් සමාජය

06. ප්‍රධාන නියෝජන ක්‍රම අතුරින් එක් ක්‍රමවේදයක් පිළිබඳ විමසුමක් කරන්න.